සිය පණ නො තකා
தனதுயிரை பணயம் வைத்தல்
At the Risk of one's own life

# වීර පොදුජන පදනම

# குடிமக்களின் வீரச்செயல்களுக்கான மன்றம்

# Foundation for Civilian Bravery

137ඒ,සිරි සිද්ධත්ථාරාම පාර,
වලාන, පානදුර.

137 ஏ, சிறி சித்தத்தாராம
வீதி, வலான, பாணந்துறை.

137A, Siri Siddattharama
Road, Walana,
Panadura, Sri Lanka.

Tel / Fax: 038 2241777 e-mail: info@civilianbravery.org Web : www.civilianbravery.org

2019 අගෝස්තු 15

## මාධ්‍ය නිවේදනය

විමසන්න : 038 2241777
(සතියේ දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 4.30 )

## 26 වැනි ජාතික විරුජන සම්මාන උළෙල 2020

<u>සම්මාන සඳහා අයදුම්පත් කැඳවීම</u>

වීර පොදුජන පදනම විසින් 2020 වර්ෂය සඳහා පිරිනමන සම්මාන සඳහා ශ්‍රී ලාංකේය පොදුජනයාගේ (Civilians) නාම යෝජනා අයදුම්පත් දැන් වීර පොදුජන පදනම වෙත භාර දිය හැකි ය. අයදුම්පත් ලැබීමෙන් පසුව විනිශ්චය මඬුල්ලක් විසින් සම්මුඛ පරීක්ෂණ සහ ඉදිරිපත් කර ඇති සාක්ෂි මත සම්මාන සඳහා පුද්ගලයන් තෝරනු ලැබේ. සම්මාන නිර්ණායක පහත දැක්වේ.

1. <u>ජාතික විරුජන සම්මාන</u>
   සිය ජීවිතයට හෝ ශාරීරිකව ඇති විය හැකි අනතුරු නොසලකා අභීතව ස්වේච්ඡාවෙන් ඉදිරිපත්ව ගංවතුරෙන්, ගින්නෙන්, පතල් ආශ්‍රයෙන් සහ රළු මුහුදේ මෙන්ම ස්වභාවයෙන් ඇති වූ හෝ මිනිසා විසින් උත්පාදනය කළා වූ කුමන හෝ ආපදා අවස්ථාවකට බඳුන් වූ ජීවිත බේරා ගන්නට තැත් කළ ශ්‍රී ලංකේය පොදුජනතාව (Civilians) මෙම සම්මාන ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබති. තෝරාගැනීමේ නිර්ණායක වන්නේ බේරාගනු ලැබූ අයගේ සහ බේරාගත් අයගේ ජීවිතයට වූ තර්ජනය සහ ස්වේඡාව වේ. බුදල් නා ස්වර්ණ සම්මානය සහ විරුජන රජත මුද්‍රිකා මේ සඳහා පිරිනැමෙන සම්මාන වේ.

2. <u>විරුජන ප්‍රජා සබැඳියාව සම්මානයඃ</u>
   මෙම සම්මානය ජනවාර්ගික සබැඳියාව තර්ජනයට ලක් වූ අවස්ථාවක සාමය පවත්වාගෙන යාම උදෙසා ප්‍රජා සබැඳියාව සහ ඒකාබද්ධතාවය වර්ධනය කිරීමට තමා අයත් හෝ වෙනත් ප්‍රජාවක ජීවිත ආරක්ෂා කිරීම අරමුණු කොටගෙන සිය ජීවිතය පරදුවට තබා කටයුතු කළ අයෙකුට මෙම සම්මානය පිරිනැමේ.

3. <u>ජෛවහිතකාමී සම්මානය</u>
   ශ්‍රී ලංකාවේ ජෛව සම්පත් සහ පද්ධතීන් ඇතුළු ස්වභාවික පරිසර සංරක්ෂණය සහ ප්‍රගමණය උදෙසා ස්වේච්ඡාවෙන් කරන ලද ක්‍රියාවන් මෙම සම්මානයෙන් අගය කෙරේ.

4. <u>ශිෂ්‍ය විරුජන සමාජ ක්‍රියාකාරකම් සම්මානය</u>
   ස්වර්ණ හා රජත හංස මුද්‍රිකා - සමාජ සේවය උදෙසා පාසැල් පද්ධතිය තුළ පිළිගත් සංගමයක කැපී පෙනෙන, ක්‍රියාකාරී සාමාජිකයකු වශයෙන් එහි පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට ධෛර්යවන්තව සහ කැපවීමෙන් කරන ලද කාර්ය භාරය ඇගයීමට පාසැල් සිසුන් සඳහා මෙම සම්මානය පුද කෙරේ.

<u>පොදු කොන්දේසි</u>

1. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2020-03-31
2. අදාළ කාලය 2019 ජනවාරි 1 සිට 2019 දෙසැම්බර් 31
3. අයදුම්පත් පදනම වෙත කරන ඉල්ලීමක් මත ලබාගත හැකි අතර එම අයදුම්පත සම්මාන අපේක්ෂක විසින් හෝ ඔහු වෙනුවෙන් සිද්ධිය ගැන දන්නා වෙනත් අයකු විසින් හෝ ඉදිරිපත් කළ හැකි ය.
4. අදාළ සිදුවීම සිය රාජකාරී වපසරිය තුළ සිදුවී ඇත්නම් එය සම්මාන සඳහා සළකා බැලීමට හැකි වන්නේ උක්ත ක්‍රියාවලිය රාජකාරියෙන් පරිභාහිරද ඉන් ඔබ්බට ද ගොස් ඇති ද යන කාරණය මත වේ.
5. අදාළ ක්‍රියා සනාථ කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීම අයදුම්කරු සහ සම්මාන අපේක්ෂකයා සතු පූර්ණ වගකීම වේ.
6. පාසැල් සිසුන් ඔවුන්ගේ අයදුම්පත් විදුහල්පතිගේ නිර්දේශ සමඟ ඉදිරිපත් කළ යුතුය.
7. පසුගිය බුදල්නා සම්මානලාභීන් මේ සඳහා සළකා බලනු නොලැබේ.
8. ඉහත කොන්දේසි දැඩිව සළකා බලන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.